# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2238/19 - 2021 ජූලි මස 29 වැනි බ්‍රහස්පතින්දා - 2021.07.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පිළිවෙලින් 44 (1), 45 (1) සහ 47 (1) (අ) (ආ) ව්‍යවස්ථාවන්ට අනුකූලව, මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2020 අගෝස්තු මස 09 දිනැති අංක : 2187/27 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය, වරින් වර සංශෝධනය කරන ලදුව, 2021 ජූලි මස 27 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් ලෙස තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**ගෝඨාභය රාජපක්ෂ,**
ජනාධිපති.

2021 ජූලි මස 27 වැනි දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ - 01.

1A - G 34726 — 380 (2021/07)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(1) එම නිවේදනයෙහි අංක "31.0 මහජන ආරක්ෂක අමාත්‍ය" ශීර්ෂය යටතේ වන "03. සුවිශේෂී ප්‍රමුඛතා සහ 04. අදාළ ආයතනික හා නෛතික රාමුව" සම්බන්ධයෙන් පහත පරිදි;

03. සුවිශේෂී ප්‍රමුඛතා :

1. මහජන ආරක්ෂාව තහවුරු කිරීම ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකා පොලිස් සේවයේ සේවා මට්ටම ඉහළ නැංවීම.
2. සමාජය මත්ද්‍රව්‍ය උවදුරෙන් නිදහස් කර ගැනීමේ වැඩපිළිවෙළ ප්‍රජා මට්ටමෙන් මෙන්ම පාසැල් හා අධ්‍යාපන ආයතනවල දරුවන් රාජ්‍ය හා පෞද්ගලික සේවා ස්ථාන ඉලක්කගත වැඩසටහන්, ආගමික මධ්‍යස්ථාන, සමාජ සංවිධාන රාජ්‍ය හා පෞද්ගලික අංශ සමගින් ක්‍රියාත්මක කිරීම.
3. අභ්‍යන්තර ආරක්ෂාව තහවුරු කිරීම ඉලක්ක කර ගනිමින් අන්තවාදය හා ත්‍රස්තවාදී කටයුතු වලක්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
4. ජන ජීවිතය සුරක්ෂිතව පවත්වා ගැනීම සඳහා මංකොල්ලකෑම්, මිනීමැරීම්, සමාජ විරෝධී ක්‍රියාවන් හා අපරාධ මර්ධනය කිරීම හා මැඩපැවැත්වීම.
5. රටේ සියළුම පුරවැසියන්ට, විශේෂයෙන්ම කාන්තාවන්ට හා දරුවන්ට නිදහසේ තම ජීවිත ගත කිරීමට අවශ්‍ය රැකවරණය සැමවිටම පවත්වාගෙන යෑම.
6. රථ වාහන භාවිතයේදී මාර්ගවල සිදුවන අක්‍රමිකතා මෙන්ම මාර්ග අනතුරු සිදුවන මරණ, ආබාධ, රෝහල් ගතවීම් වලක්වා ගැනීම හා අවිධිමත් හා නොසැලකිලිමත් රිය පැදවීම් මංතීරු හා මාර්ග සංඥා උල්ලංඝනය කිරීම මෙන්ම විශේෂයෙන් නාගරික ප්‍රදේශවල අවිධිමත් රිය පැදවීම් හා මග දෙපස රථවාහන නතරකර තැබීම් නිසා ඇතිවන මාර්ග තදබදය අවම කර ක්‍රමවත් රථවාහන ධාවන නියාමන ක්‍රමවේදයක් හා නීතිමය රාමුවක් ක්‍රියාත්මක කිරීම සඳහා රථවාහන පොලීසිය ප්‍රතිසංවිධානය කර නවීන තාක්ෂණ හා ක්‍රමෝපායන් යොදාගනිමින් නවීකරණය කිරීම.

04. අදාළ ආයතනික හා නෛතික රාමුව :

| *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
|---|---|
| 1. ශ්‍රී ලංකා පොලීසිය<br>2. ජාතික පොලිස් අභ්‍යාස ආයතනය | ■ පොලිස් ආඥා පනත (1865 අංක 16)<br>■ ජාතික පොලිස් අභ්‍යාස ආයතනය පනත (2011 අංක 44) |

(2) එම නිවේදනයෙහි අංක "1.0 ආරක්ෂක අමාත්‍ය" ශීර්ෂය යටතේ වන "03. සුවිශේෂී ප්‍රමුඛතා සහ 04. අදාළ ආයතනික හා නෛතික රාමුව" සම්බන්ධයෙන් පහත පරිදි;

03. සුවිශේෂී ප්‍රමුඛතා :

1. අභ්‍යන්තර කැරලි, ත්‍රස්තවාදී ක්‍රියා මැඩපැවැත්වීම හා බාහිර බලපෑම්වලින් ආරක්ෂා කිරීම.
2. මුහුදු සීමා උල්ලංඝනය කරමින් නීති විරෝධී භාණ්ඩ හා සේවා ජාවාරම් වලක්වාලීම.
3. මත්ද්‍රව්‍ය උවදුරෙන් නිදහස් රටක් ඇති කිරීම සඳහා මත්ද්‍රව්‍ය මෙරටට ඇතුළු වීම වැළැක්වීම, මත්ද්‍රව්‍ය උවදුර පාලනය කිරීම, මත්ද්‍රව්‍ය උවදුරට ගොදුරු වීම වැළැක්වීම හා මත්ද්‍රව්‍ය උවදුරට ගොදුරුවූවන් පුනරුත්ථාපනය සඳහා අදාළ ජනාධිපති කාර්ය සාධක බලකාය සමග ඒකාබද්ධව කටයුතු කිරීම.
4. ග්‍රාමීය ප්‍රජා ආරක්ෂාව හා සුභ සාධනය සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීම.
5. බහු කාර්ය සංවර්ධන කටයුතු සඳහා දිළිඳු පවුල්වල රැකියා හා ජීවනෝපාය දායකත්වය වැඩිවන අයුරින් දිළිඳු බව තුරන් කිරීමේ කාර්යයන් සඳහා මෙන්ම අනෙකුත් සංවර්ධන ක්ෂේත්‍ර සඳහා බහුකාර්ය සංවර්ධන කාර්ය සාධන බලකාය වෙත යොමු කිරීම.

04. අදාළ ආයතනික හා නෛතික රාමුව :

| *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
|---|---|
| 1. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය<br>2. ශ්‍රී ලංකා යුද හමුදාව<br>3. ශ්‍රී ලංකා නාවික හමුදාව<br>4. ශ්‍රී ලංකා ගුවන් හමුදාව<br>5. රාජ්‍ය බුද්ධි සේවාව<br>6. ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව<br>7. සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය<br>8. ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය<br>9. ජාතික ශිෂ්‍යභට බලකාය<br>10. මිලෝදා ආයතනය (ACADEMY OF FINANCIAL STUDIES) කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පීඨයක් ලෙස<br>11. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව<br>12. බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුව | ■ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී පනත (2009 අංක 35)<br>■ යුධ හමුදා පනත (1949 අංක 17)<br>■ නාවික හමුදා පනත (1950 අංක 34)<br>■ ගුවන් හමුදා පනත (1949 අංක 41)<br>■ වෙරළාරක්ෂක දෙපාර්තමේන්තු පනත (2009 අංක 41)<br>■ උද්ඝෝෂණ නීතිය (1977 අංක 8)<br>■ ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය පනත (2008 අංක 5)<br>■ පුරාවස්තු පනත (1956 අංක 21)<br>■ ගිනි අවි ආඥා පනත (1916 අංක 33)<br>■ වෙඩිපිටි සහ යුධ හමුදා පුහුණුවීමේ පනත (1951 අංක 24)<br>■ උපයෝගිතා හා පරිපූරක පනත (1985 අංක 40)<br>■ පීඩාකාරී අවි පනත (1966 අංක 18)<br>■ මුහුදු කොල්ලකෑම් පනත (2001 අංක 9)<br>■ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (1979 අංක 48)<br>■ මහජන ආරක්ෂක ආඥා පනත (1947 අංක 25)<br>■ ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය පනත (1981 අංක 68)<br>■ ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාර මැඩපැවැත්වීමේ පනත (1999 අංක 11)<br>■ සමුද්‍රීය සංතරණයේ ආරක්ෂාවට එරෙහිව සිදුකරනු ලබන නීති විරෝධී ක්‍රියා මැඩපැවැත්වීමේ පනත (2000 අංක 42) |

08 - 111

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.